## මාර්ග සංවර්ධන අධිකාරියේ එක්සත් සුභසාධක මහා සමිති සංගමයේ අතුරු ව්‍යවස්ථාව

### 1. පරමාර්ථ, බලතල සහ සමාජිකත්වය

**1-1 නාමය**

1-1-1 මෙම සමිතියේ නාමය මාර්ග සංවර්ධන අධිකාරියේ එක්සත් සුභසාධක මහා සමිති සංගමය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1-1-2 මින්මතු අතුරු ව්‍යවස්ථාවල එට ' මහා සමිති සංගමය' වශයෙන් හැඳින්වෙයි.

**1-2 ලිපිනය**

1-2-1 සමිතියේ ලිපිනය 'සෙත්සිරිපාය' පරිපාලන සංකීර්ණය, බත්තරමුල්ල හෝ සමිතියේ මහා සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයක් වන්නේය.

1-2-2 මෙසේ ලිපිනය වෙනස්වීම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ලෙස නොසැලකිය යුතුය.

**1-3 පරමාර්ථ හා අරමුණු**

1-3-1 අධිකාරියේ සේවයේ නියුතු සමිතියේ සාමාජිකත්වය ලබා සිටින සමාජිකයන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ ක්‍රීඩා පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීමත් සාමාජිකයන් තුල සකසුරුවම් තම හා ඔවුනොවුන් අතරෙහි අන්‍යෝන්‍ය සුභදතාවය හා ආචාරශීලී බව වර්ධනය කිරීමත් මෙම පරමාර්ථයන් හා අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය වන ක්‍රියා මාර්ග යෙදීම වෙනුවෙන් ඇති ඉඩකඩ වර්ධනය කිරීමත් වේ.

**1-4 බලතල**

ඉහත සඳහන් පරමාර්ථ සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අනුව පහත දැක්වෙන කටයුතු කිරීමට බලය ඇත්තේය.

1-4-1 සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුදල් ඇති කිරීම.

1-4-2 ශාරීරික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම සඳහා ක්‍රීඩා පහසුකම් හා පුස්තකාල පහසුකම් ලබාදීම හා ඒවාට අනුබලදීම.

1-4-3 ආත්ම උපකාරය, අන්‍යෝන්‍යාධාරය සහ සදාචාරය පිළිබඳ ගුණධර්ම සාමාජිකයන් තුල ප්‍රගුණ කිරීම.

~~1-4-4 සකසුරුවම් හා මුදල් ඉතිරි කිරීම පිළිබඳ වූ කටයුතු ඇති කිරීම.~~

1-4-5 බැංකු කටයුතු කිරීම හා සාමාජිකයන්ට ණයට මුදල් සැපයීම.

1-4-6 සාමාජිකයන්ට අවශ්‍ය වන ද්‍රව්‍ය සැපයීමේ නියෝජිතයෙකු වශයෙන් ක්‍රියා කිරීම.

1-4-7 ඉහත සඳහන් පරමාර්ථයන් ඉටු කර ගැනීමට අවශ්‍ය හා අදාළ වන්නා වූ සියළුම කටයුතු කිරීමත් වේ.

**1- 5 සාමාජිකත්වය සහ සාමාජිකත්වයට ඇතුලත් කර ගැනීම**

1-5-1 අධිකාරියේ මාසික වැටුප් ලබන ස්ථිර හෝ අනියම් පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත හෝ සේවයේ යොදවා සිටිනු ලබන සියළුම නිලධාරී හා සේවක මහත්ම මහත්මීන් අනිවාර්යයෙන්ම මෙම සමිතියේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබා සිටිත්.

1-5-2 සාමාජිකත්වය ලැබීමට ව්‍යවස්ථානුකූලව සුදුසුකම් ලබා ඇති අය විසින් සමිතිය පිළිගත් අයදුම් පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට සමිතියේ ලේකම් තැන විසින් විධායක සභාවට ඉදිරිපත් කිරීමෙන් හා විධායක සභාව සහ අනුමත කිරීමෙන්.

**1-6 සාමාජික මුදල්**

1-6-1 සෑම සාමාජිකයෙකු විසින්ම ඇතුල්වීමේ ගාස්තු වශයෙන් රු: 5/- ක් ගෙවිය යුතුය.

1-6-2 සෑම සාමාජිකයෙකු විසින්ම සාමාජිකත්වය ලබා ගත් මාසයේ සිට සාමාජික මුදල් වශයෙන් මාස්පතා රු: 3/- බැගින් වූ මුදලක් ගෙවිය යුතුය.

1-6-3 සෑම සාමාජිකයෙකු විසින්ම ඔහුගේ /ඇයගේ ඇතුලත්වීමේ ගාස්තු සහ සාමාජික මුදල් තමන්ගේ වැටුපෙන් අය කර ගැනීමේ කැමැත්ත ලිඛිතව ප්‍රකාශ කල යුතුවේ.

**1-7 සමිතියේ ලියාපදිංචි කිරීම**

1-7-1 මෙම සමිති සංගමය සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ ප්‍රකාර සමිති සමාගම් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පිළිගත් සමිතියක් වශයෙන් ලියාපදිංචි කිරීම කලයුතුවේ.

**1-8 සාමාජිකත්වය නාම ලේඛනය**

1-8-1 සාමාජික නාම ලේඛණයෙහි මෙහි පහත සඳහන් කරුණු ඇතුලත් කිරීම ක[illegible] කල යුතුවේ.

අ) සාමාජිකයාගේ නම, පුද්ගලික ලිපිනය රැකියා ස්ථානයේ ලිපිනය , රැකියාව.

ආ) සාමාජිකයාගේ වයස සහ සාමාජික ලේඛනයේ ඇතුලත් කල දින

(ඈ) සාමාජිකයාගේ සාමාජිකත්වය නැතිවූ දිනය

(ඉ) සාමාජිකයා විසින් තමාගේ මරණයෙන් පසු තම අයිතිවාසිකම් පැවරුම් කරනු ලබන සාමාජිකයාගේ බිරිඳ, දරුවන් සහ මව පියා යන අයගේ විස්තරය

## 1-8 සාමාජික යුතුකම් හා අයිතිවාසිකම්

1-8-1 සාමාජිකත්වය සඳහා විධායක සභාවෙන් අනුමත කෙරෙන තෙක් කිසිම තැනැත්තෙකුට සාමාජික අයිතිවාසිකම් හා බලතල කිසිවකටත් හිමිකමක් ඇති නොවන්නේය.

1-8-2 මහා සභාව සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.
එක සාමාජිකයෙකුට ඇත්තේ එක් ඡන්දයක් පමණි. නියෝජිතයෙකු මගින් ඡන්දය දීමට ඉඩ දෙනු නොලැබේ.

1-8-3 ගෙවිය යුතු සාමාජික මුදල් ගෙවීම කල්පසු කොට ඇති කවර සාමාජිකයෙකුට වුවත් ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිවාසිකමක් නැත්තේය.

1-8-4 සාමාජිකයෙකුගේ මිය යාමෙන් පසුව තම අයිතිවාසිකම් හිමිවන තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම් ලිඛිතව සාමාජික සමිතියට දැනුම් දිය යුතුය.

1-8-5 මියගිය සාමාජිකයෙකුගේ අයිතිවාසිකම්වල වටිනාකම ඔහු විසින් සමිති සංගමයට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් වේ නම් එය අඩුකර ගැනීමෙන් පසුව ඉතිරි මුදල පමණක් ඉහත නියමිත තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවිය යුතුවේ.

1-8-6 එබඳු ගෙවීමක් සාමාජිකයාගේ මරණයෙන් මාසයකට පෙරාතුව ගෙවා අවසන් කළ යුතුවේ.

## 1-9 සාමාජිකත්වය අහෝසි වීම

1-9-1 සාමාජිකත්වය නැති වන්නේ පහත සඳහන් එක් කරුණක් හෝ ඉන් වැඩි ගණනක් හේතු කොට ගෙනය.

(අ) මාගී සංවර්ධන අධිකාරියෙන් ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම

(ආ) මරණය

(ඇ) මහා සභාවේ නියෝජිත සංඛ්‍යාවෙන් 2/1කට අඩු නොවූ සංඛ්‍යාවකින් යුත් මහා සභා රැස්වීමකදී 3/2 හෝ ඊට වැඩි ගණනක්ගේ ඡන්දයෙන් සාමාජිකත්වය නෙරපා හැරීම

(ඈ) සමිතියේ මුදල් අයිසි අන්දමින් පාවිච්චි කිරීම.

...4/2

## 1-10 සාමාජිකත්වය නෙරපා හැරීම

1-10-1 (අ) මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කරන්නා වූ හෝ

(ආ) සමිතියේ දියුණුවට බාධා වන පරිදි වෙනත් කටයුතු කරන්නා වූ සාමාජිකයින්ගේ සාමාජිකත්වය විධායක සභාව විසින් අත්හිටුවා ඔවුන්ගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් ලබා දිය යුතුය.

(ඇ) එසේ ඉදිරිපත් කරනු ලබන කරුණු පිළිගත හැකි නොවන්නේ නම් හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම පැහැර හරින ලද්දේ නම් හෝ එවන් අවස්ථාවන් හිදී සාමාජිකත්වය අත්හිටුවා විධායක සභාව විසින් මහා සභාවට දැනුම් දිය යුතුවේ. ඉදිරිපත් කරනු ලබන නිදහසට කරුණු පිළිබඳව සාමාජිකයාට මහා සභාව සමඟ අදහස් ප්‍රකාශ කිරීමට අයිතිය ඇත. මහා සභාව විසින් එබඳු සාමාජිකයෙකු නෙරපා හළ යුතු යැයි අදහස් කරන්නේ නම් මෙම අතුරු ව්‍යවස්ථාවේ 1-9 (ඇ) දරන වගන්තිය පරිදි ක්‍රියා කළ යුතුය.

## 2 වන පරිච්ඡේදය - මූල්‍ය

### 2-1 ප්‍රාග්ධනය

2-1-1 සමිතියේ ප්‍රාග්ධනය පහත සඳහන් මුදල් වලින් සමන්විත වේ එනම්,

(අ) සාමාජික මුදල්
(ආ) මරණාධාර මුදල්
(ඇ) පරිත්‍යාග මුදල්
(ඈ) බාහිර ණය

### 2-2 මුදල් පරිහරණය

2-2-1 සමිතියේ ප්‍රකාශිත පරමාර්ථ හා බලතල සපුරා ගැනීම පිණිස ඉවහල් වන කරුණු වලට සමිතියේ මුදල් යෙදවිය හැකිය.

2-2-2 සමිතියේ චෙක්පත් හා මුදල් ආපසු ලබා ගැනීමේ පෝරම සභාපති හෝ උප සභාපති හා භාණ්ඩාගාරිකයන අය විසින් අත්සන් කළ යුතුවේ.

2-2-3 සෙත්සිරිපාය පරිපාලන සංකීර්ණයේ ලංකා බැංකු ශාඛාවේ ඉතිරි කිරීමේ හා ජංගම යන ගිණුම් විවෘත කළ යුතුය.

## 2-3. මුදල් වර්ෂය

2-3-1 සමිතියේ මුදල් වර්ෂය සෑම ලිත් වර්ෂයකම
යන දිනෙන් ආරම්භ වී
යන දිනෙන් අවසන් වේ.

## 3 වන ඡේදය සමිතියේ මහා සභාව

### 3-1 සංවිධානය හා රැස්වීම් පැවැත්වීම

3-1-1 සමිතියේ පූර්ණ බලය උත්තරීතර මණ්ඩලය වන මහා සභාවට පැවරේ ?

3-1-2 සමිතියේ වාර්ෂික ~~නියෝජිත~~ මහා සභා රැස්වීම

සමිතියේ මුදල් වර්ෂය අවසන් වූ දින සිට මාස 3 ක් ඉකුත් වීමට ප්‍රථම යෙන් පැවැත්විය යුතුය.

3-1-3 ~~කාරක~~ විධායක සභාව විසින් හෝ සමිතියේ සභාපති විසින් හෝ නියම කළ විටක හෝ යටත් පිරිසෙයින් මුළු සාමාජික සංඛ්‍යාවෙන් 3/1 කට අඩු නොවන පිරිසක් විසින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටි විටද සමිතියේ ලේකම් විසින් මහා සභාව රැස් කිරීමට ක්‍රියා කළ යුතුය.

3-1-4 වාර්ෂික නියෝජිත මහා සභා රැස්වීම කැඳවීමේ අදහස් යටත් පිරිසෙයින් දින ~~10~~ 20 කටත් කල් ඇතිව සාමාජිකයින්ට දැනුම් දිය යුතුය. එවැනි රැස්වීමක දී ඉදිරිපත් කළයුතු යෝජනා වෙත් නම් රැස්වීම පැවැත්වීමට නියමිත දිනට දින 10 කකට වත් කලින් සමිතියේ ලේකම් තැනට ලිඛිතව දැනුම් දිය යුතුය. සාමාජිකයින්ගෙන් ලැබෙන යෝජනා ද න්‍යාය පත්‍රයත් සමග රැස්වීම පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානයද සම්බන්ධවූ නිවේදනයක් රැස්වීම පැවැත්වීමට දින 7 කට කලින් සාමාජිකයින්ට දැනු ම් දිය යුතුය.

### 3-2 ගණපූර්ණය

3-2-1 සමිතියේ මහා සභා රැස්වීමක් හෝ විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය ගණපූර්ණය වශයෙන් සැලකිය යුත්තේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි(1/3) කි.

## 3-3 මහා සභාවේ බලතල හා කාර්යාල

3-3-1 ප්‍රධාන සභාපති, උප සභාපතිවරු දෙදෙනෙත්, ප්‍රධාන ලේකම්, උප ලේකම්වරයෙත් ප්‍රධාන භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරිකවරු දෙදෙනෙකු, ක්‍රීඩා ලේකම්, සංස්කෘතික ලේකම්, පුස්තකාල ලේකම්, මරණාධාර ලේකම්, ණය සහනාධාර ලේකම් ඇතුලත් වන පරිදි 06 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් සාමාජිකයින් අතුරෙන් විධායක සභාවට තෝරා පත්කර ගැනීම, එවුන්ගේ වැඩ අත්හිටුවීම හා ඔවුන් අස්කිරීම,

3-3-2 අනුශාසකවරු දෙදෙනෙකු පත්කර ගැනීම, අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරින් දෙදෙනෙකුගෙන් මේ අය සමන්විත විය යුතුය.

3-3-3 වාර්ෂික ගණන් පරීක්ෂණ වාර්තාව, අයවැය වාර්තාව සළකා බැලීම.

3-3-4 විධායක සභාවේ නිර්දේශය මත ඇතුලත් කරගන්නා ලද සාමාජිකයන්ගේ සාමාජිකත්වය තෙරපීම

3-3-5 අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

3-3-6 මහා සභාවේ සාමාජිකයන්ගෙන් තිදෙනෙකුගෙන් යුත් අභ්‍යන්තර විගණන කමිටුවක් පත් කිරීම.

3-3-7 අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම පිළිබඳ යෝජනාව අතහැර අන්සෑම කරුණක් තීරණය කළ යුත්තේ සභා රැස්වීමට පැමිණි සිටි වැඩි දෙනාගේ ඡන්දයෙනි. මේ යෝජනාවක් සම්බන්ධව ඡන්ද ගණන සමාන වූ විටෙක එම යෝජනාවා නිෂ්ප්‍රභා වූවාසේ සැලකිය යුතුය.

3-3-8 මහා සභාවේ කරන සාකච්ඡා හෙවත් තීරණය කරනු ලබන සියළුම කරුණු පොතක සටහන් කර ගෙන තිබිය යුතුය. සෑම වාර්තාවක්ම ලේකම්, සභාපති දෙදෙනාගේ අත්සනින් තහවුරු කළ යුතුය.

## කළමනාකරණ සංවිධානය

## 4-1 විධායක සභාව

4-1-1 ව්‍යවස්ථාවේ 3-3-1 වගන්තිය සඳහන් අයගෙන් විධායක සභාව සමන්විත වේ. මෙසේ තෝරා පත්කර ගත් විධායක සභිකයින්ගේ නිල කාලය සමිතියේ ඊළඟ රැස්වීමේ දී අවසන් වේ. එසේ නිල අහිමි වන කාරක සභිකයින් නැවතත් තෝරා පත්කර ගත හැකිය.

4-1-2 යටත් පිරිසෙයින් මසකට එක් වරක්වත් රැස්වීම් පැවැත්විය යුතුය. එහෙත් අවශ්‍යතාවය අනුව වැඩ වාර ගණනක් රැස්වීම් පැවැත්වීමට බාධාවක් නැත.

4-1-3 අවශ්‍ය ගණ පූර්ණය සඳහා සභිකයින් 1/2 ට වඩා වැඩි ගණනක් පැමිණ සිටීම ප්‍රමාණවත්ය.

.....7

4-1-4 රැස්වීමට පැමිණ සිටින වැඩිදෙනාගේ කැමැත්ත අනුව හැම කරුණක්ම තීරණය විය යුතුය.

4-1-5 සමිතියේ විවිධ අංශවලට තෝරාපත් කර ගන්නා ලද ලේකම් වරුන්ට සහාය වීම සඳහා විවිධ අනුකාරක සභා පත් කිරීම, ඊට අදාළ උපදෙස් නිකුත් කිරීම හා පාලනය කිරීම, එකී අනුකමිටුවල සභාපතිත්වය අංශභාර ලේකම්ට පැවරෙනු ඇත.

4-1-6 විධායක සභාවේ ඇතිවන පුරප්පාඩු සඳහා සුදුසු පුද්ගලයින් මහා සභාවේ අනුමැතියට යටත්ව තෝරාපත්කර ගත හැකිය. එසේ පත්කර ගනු ලැබූ සභිකයින්ගේ නිල කාලය විධායක සභාවේ නිල කාලය අවසන් වීමත් සමගම අවසන් වන්නේය.

## 4-2 නිලධාරීන්

### 4-2-1 සභාපති

ලේකම් හා අනෙකුත් අයගේ වැඩ පරිපාලනය කිරීමේ බලය ඔහුට ඇත. සමිතියේ මහා සභාවේ සහ විධායක සභාවේ රැස්වීම් වල තීරණය කාර්යක්ෂම පරිදි ක්‍රියාත්මක කරන බවට ඔහු විසින් වගකිව යුතුය. සභාපති නොමැති අවස්ථා වලදී උප සභාපති විසින් ඉහත සඳහන් කටයුතු කළ හැකිය.

### 4-2-2 ලේකම්

(අ) සමිතිය වෙනුවෙන් ලිපි ගනුදෙනු කිරීම මහා සභා රැස්වීම්, විධායක සභා රැස්වීම් කැඳවීම ඒවායේ තීරණ පිළිබඳ වාර්තා ගත කිරීම.

(ආ) සමිතියේ මුද්‍රාව සහ පොත්පත් ලිපිලේඛණ තම භාරයේ තබා ගැනීම හා ඒවායේ තීරණ පිළිබඳ වාර්තා ගත කිරීම.

(ඇ) විධායක සභාව විසින් නියම කරනු ලබන වෙනත් සියළුම කටයුතු කිරීම.

### 4-2-3 භාණ්ඩාගාරික.

(අ) සියළුම ආකාරයේන් සමිතියට ලැබෙන සියලුම මුදල් භාරගෙන මහ සභාවේ තීරණයන් පරිදි වැය කිරීම. දිනපතා මුදල් පොතේ දැක්වෙන අත ඉතිරි මුදල් නිවැරිදි බවට එහි අත්සන තැබීමෙන් සහතික කළ යුතුය.

(ආ) රු: 250/= අධිකවන සමිතියේ සියළුම මුදල් අනුමත කළ බැංකුවේ සමිතිය නමින් තැන්පත් කළ යුතුවේ.

...8

5-3-1 විගණන කමිටුව

(අ) මහා සභාව විසින් පත් කරනු ලබන විගණන කමිටුව ඊළඟ සංවත්සර මහ සභා රැස්වීම දක්වා නිල දැරිය යුතුවේ.

(ආ) ඔවුන් විසින් තමන් අතුරෙන් කෙනෙකු කමිටුවේ ලේකම් වශයෙන් පත්කර ගත යුතුය.

(ඇ) සමිතියේ පොත්පත් වල ගනුදෙනු නිසි අයුරින් ඉටු කරන්නේ ද යන්න පිළිබඳව මසකට වරක් පැවැත්වෙන විධායක කමිටුවට වාර්තා කළ යුතුය.

(ඈ) සමිතියේ මුදල් , අරමුදල් පාවිච්චිය පිළිබඳව වාර්ෂික මහාසභා රැස්වීමට විශේෂ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

5- සහන සේවා

5-1 අවමංගල්‍යාධාර

5-1-1 මහා සංගමයේ සාමාජිකත්වය ලබා ගන්නා ඕනෑම කෙනෙකුට මෙහි ද සාමාජිකත්වය ලබා ගත හැකිවේ.

5-1-2 අවමංගල්‍යාධාර සඳහා දායක මුදල රු: 10/- කි. ප්‍රතිලාභ මුදල් ගෙවිය යුත්තේ නොකඩවා මාස 3 ක දායක මුදල් ගෙවීමෙන් අනතුරුවය. දායක මුදල් ගෙවීම පැහැර හරින අයට ප්‍රතිලාභ මුදල් සඳහා හිමිකම් නොමැත.

5-1-3 ප්‍රතිලාභ මුදල් හිමිවිය යුත්තේ සාමාජිකයාගේ/සාමාජිකාවන්ගේ මෙහි පහත දක්වා ඇති යැපෙන්නන් සඳහා පමණි. ලැබිය යුතු ප්‍රතිලාභ මුදල ඉදිරියෙන් දක්වා ඇත.

(අ) සාමාජිකයාගේ/සාමාජිකාවකගේ අභාවයට රු: 2000/=

(ආ) සාමාජිකයාගේ බිරිඳ, සාමාජිකාවකගේ ස්වාමිපුරුෂයා ගේ අභාවය සඳහා රු: 1500/=

(ඇ) සාමාජිකයාගේ/සාමාජිකාවකගේ මව සහ පියා රු: 1000/=

(ඈ) සාමාජිකයාගේ 6 මසකට වැඩි අවු: 18 ට අඩු අවිවාහක ළමුන්ගේ අභාවයක් සඳහා රු: 750/=

5-1-4 අවිවාහක, සාමාජිකයා/සාමාජිකාවගේ ප්‍රතිලාභ මුදල් ගෙවීම මෙහි පහත සඳහන්

(අ) ඔහුගේ හෝ ඇයගේ මව/පියා සහෝදර, සහෝදරියකගේ අභාවයක් සඳහා රු: 1000/=

5-1-5 සාමාජිකයාගේ/සාමාජිකාවකගේ මව/පියා මියගොස් ඇත්තේ නම් එම ප්‍රතිලාභ මෙහි පහත සඳහන් පරිදි ලැබීමට හිමිකම් ඇත.

....9

6(ඉ) ඔහුගේ හෝ ඇයගේ , බිරිඳගේ හෝ ස්වාමිපුරුෂයාගේ මව/පියාගේ අභාවයේ දී රු: 1000/=

5-1-6 සාමාජික /සාමාජිකාව සඳහා මරණාධාර ගෙවනු ලබන්නේ එක් මරණයක් සිදුවූ දින සිට වර්ෂයක් ඇතුලත සිදුවන තවත් මරණයක් වෙනුවෙන් පමනි.

5-1-7 ඉහත 7-1-3 යටතේ සාමාජික/සාමාජිකාවගේ අභාවයේ දී අමතරව සංගමයේ සියළුම සාමාජික සාමාජිකාවන් ගෙන් රු: 15/= බැගින් වූ මුදලක් වැටුපෙන් අයකර මියගිය සාමාජික/සාමාජිකාවගේ ඔහු විසින් නම් කරනු ලබන බලකාරයාට හෝ නීත්‍යානුකූල උරුමකරුවන්ට ගෙවනු ලැබේ.

5-2-8 <u>අර්ථ නිරූපනය</u>

(අ) ස්වාමිපුරුෂයා/භාර්යාව යනුවෙන් හැඳින්වෙන්නේ විවාහ සහතිකයේ සඳහන් වන නීත්‍යානුකූල බිරිඳ හෝ ස්වාමිපුරුෂයාය.

(ආ) මව /පියා යනුවෙන් හැඳින්වෙන්නේ සාමාජික සාමාජිකයාගේ උප්පැන්න සහතිකයේ දැක්වෙන නීත්‍යානුකූල මව හෝ පියාවේ.

(ඇ) දරුවන් වශයෙන් හැඳින්වෙන්නේ ද තම උප්පැන්න සහතිකයේ ඇති සුජාතක නීත්‍යානුකූල දරුවන් පමණි.

(ඈ) විවාහක අයගේ නැන්දා/මාමා ලෙස පිළිගනු ලබන්නේ උප්පැන්න සහතිකයේ හා විවාහ සහතිකය සසඳා බැලීමේ දී නීත්‍යානුකූල භාවය පිළිගත හැකි නැන්දා/මාමා පමණි.

(ඉ) අවිවාහක අයගේ සහෝදර/සහෝදරියන් වශයෙන් පිළිගනු ලබන්නේ උප්පැන්න සහතිකය මගින් මව/පියාගේ නිවැරදිකාවය පිළිගත හැකි වයස අවු: 18 ට නොඅඩු සහෝදර සහෝදරියන් පමණි.

<u>ක්‍රීඩා කමිටුව.</u>

8-3-1 8-1-1 මහා සභාවෙන් තෝරා ගනු ලබන ක්‍රීඩා කටයුතු භාර ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුවසැම ශාඛාවකහා පිටි ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය වන පරිදි එක් එක් කණ්ඩායමක් සඳහා එක් එක් නියෝජිතයෙක් බැගින් මෙම ක්‍රීඩා කමිටුව නියෝජනය වේ.

8-3-2 ඒ ඒ ක්‍රීඩා කණ්ඩායම් විසින් තම කණ්ඩායම නියෝජනය කරන නියෝජිතයාගේ නම විධායක කමිටුවට භාරදීමෙන් හා විධායක කමිටුව අනුමත කිරීමෙන් පසුව ක්‍රීඩා කමිටුවේ නියෝජිතයෙකු වශයෙන් එම අයට කටයුතු කළ හැකිය.

8-3-3 අධික රිය තුළ ක්‍රීඩා කටයුතු පවත්වා ගැනීම හා සංවිධානය කිරීම මෙම කමිටුවට පැවරේ.

....10

5-3-4 සියළුම ක්‍රීඩා භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රීඩා කටයුතු පිළිබඳ ලේකම් වගකිව යුතුවේ. ක්‍රීඩා කටයුතු සම්බන්ධයෙන් වන වියදම් පිළිබඳවද ඔහු විසින් වගකිව යුතු වේ.

## පුස්තකාල කමිටුව.

5-4-1 අංග සම්පූර්ණ පුස්තකාලයක් පවත්වාගෙන යාම පුස්තකාල ලේකම්ට පැවරේ.

5-4-2 තවත් සාමාජිකයින් දෙදෙනෙකුගේ සහාය ලබා ගැනීමට ඔහුට හෝ ඇයට බලය තිබේ.

## 5-5 ණය සහනාධාර කමිටුව

5-5-1 මෙම සේවාව ලබා ගැනීම අපේක්ෂා කරනු ලබන සාමාජිකයින් විසින් රු: 100/= ක එක් කොටසක් මිලදී ගතයුතුවේ. මෙම මුදලට පොලී මුදල් ගෙවනු නොලැබේ.

5-5-2 ණය මුදල් ලබා ගැනීමේ හැකියාව රඳා ඇත්තේ තමන් විසින් මාස් පතා තැන්පත් කරනු ලබන තැන්පත් මුදල මතය. මෙම මුදලට පොලී මුදල් ගෙවනු ලැබේ.

5-5-3 ණය මුදල් ගෙවීම කළ යුත්තේ ඒ ඒ සාමාජිකයාගේ හැකියාව මත විධායක සභාව විසින් අනුමත කරනු ලබන උපරිම ණය මුදලේ සීමාව පදනම් කරගෙනය.

5-5-4 මෙසේ ගන්නා වූ ණය මුදල සඳහා විධායක සභාව මගින් අනුමත කරනු ලබන පොලී මුදලක් ද ගෙවිය යුතුවේ.

## 6 ආයතනික කාර්යයන්

## 6-1 අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

6-1 මෙම අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැක්කේ සමිතියේ පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවකට (1/2) අඩු නොවන ගණනක් රැස්වූ මහා සභාවක දී 3/4 එතරෙන් නූනත හෝ ඊට වැඩි ගණනකගේ කැමැත්ත අනුව සම්මත වූ යෝජනාවකිනි.

## 6-2 කාරක නියෝග

6-2-1 පහත සඳහන් ශීර්ෂ යටතේ විධායක සභාව මගින් කාරක නියෝග සකස් කළයුතුවේ.

(අ) සාමාජිකත්වයට බඳවා ගැනීම
(ආ) සමිතියේ මුදල් පරිහරනය කිරීම
(ඇ) අරමුදල් [illegible]ගැනීම හා අරමුදල් පාලන කිරීම
(ඉ) ඒ ඒ අනුකමිටු වලට සම්බන්ධිත ව්‍යවස්ථා සකස් කිරීම
(ඊ) කාරක සභිකයන්ගේ [illegible] ධර්ම.

....

## 6-3 සංගමය විසුරුවා හැරීම

6-3-1 රැස්කරන විශේෂ මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක්(2/3) සංඛ්‍යාවකගේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර ගැනීමෙන් පමණක් සංගමය විසුරුවා හැරිය යුතුවේ.

6-3-2 සංගමය විසුරුවා හැරීමේ දී සංගමය වෙනුවෙන් නීත්‍යානුකූලව සියළුම ණය හා බැරකම් පියවීමෙන් පසු ඉතිරිවන මුදල් හා දේපල සංගමය විසුරුවා හැරීමට කැඳවන ලද මහා සභා රැස්වීමේ දී සාමාජිකත්වය විසින් ගන්නා ලද තීරණ පරිදි යෙදවිය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාව ..88-10-19...... දින මුළු සාමාජිකයින් ~~110~~ 257 ..... න් ......110..... ක් සහභාගී වූ මහා සභා රැස්වීමේ දී ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

[illegible signature]
ලේකම්

[illegible signature]
සභාපති.